පොල් සංවර්ධන අධිකාරිය - 2019
-------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
--------------

1.1 තත්ත්වාගණනය කළ මතය
------------------------------

පොල් සංවර්ධන අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම
---------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.**

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

**1.5.1** ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

---

| | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 24 (අ) ඡේදය ප්‍රකාරව අස්ථිත්වයන් විසින් අයවැයගත සංඛ්‍යා සහ සත්‍ය සංඛ්‍යාවන් වෙන වෙනම නිරූපණය කළ හැකි පරිදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන වල එසේ අයවැය ගත සංඛ්‍යා ඇතුළත් කර නොතිබුණි. | ප්‍රමිත අංක 01 හි 24 (අ) ඡේදයේ සඳහන් පරිදි අයවැයගත සංඛ්‍යා සහ සත්‍ය සංඛ්‍යාවන් වෙන වෙනම නිරූපණය කළහැකි පරිදි 2020 වසරේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත. | ප්‍රමිතිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන තුළ අයවැය ගත සංඛ්‍යා ඉදිරිපත් කළ යුතු |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 2 පටහැනිව කාරක ප්‍රාග්ධන අයිතමයන් ගැලපීමට පෙර මෙහෙයුම් ලාභය රු.44,580,305 ක් අඩුවෙන්ද ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.51,508,806 ක් වැඩියෙන්ද මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.873,493 ක් වැඩියෙන්ද මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි දක්වා තිබුණි. | විගණන වාර්තාවෙහි පෙන්වා දී ඇති පරිදි 2019 වර්ෂයට අදාළ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සංශෝධනය කිරීමට පියවර ගෙන ඇත. | ප්‍රමිතිය ප්‍රකාරව නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළ සේවක වෛද්‍ය රක්ෂණ වියදම රු.6,424,960 ක් වුවත් එය මූල්‍ය කාර්සාධන ප්‍රකාශයෙහි රු.5,268,328 ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයෙහි අතිරික්තය රු.1,156,632 කින් වැඩියෙන් දක්වා තිබුණි. එසේම එම සේවක වෛද්‍ය රක්ෂණ වියදම සේවක පරිශ්‍රමික වියදම් යටතේ දැක්විය යුතු වුවත් එය ප්‍රවාහන සන්නිවේදන හා වෙනත් සේවා යටතේ දක්වා තිබුණි. | 2018/2019 වර්ෂයට අදාළ යෙදවුම් බදු (Input Tax) ගැලපීම සිදු නොවීම මත මෙම වෙනස ඇති වී ඇත. 2020 වසරේ අවසාන ගිණුම් සැකසීමේදී මෙම අගය නිවැරදි කිරීමට පියවර ගනු ඇත. | වර්ෂයට අදාළ වියදම නිවැරදිව හඳුනාගත යුතු අතර නිවැරදිව වියදම් වර්ගීකරණය කළ යුතුය. |
| (ආ) | වටිනාකම රු.88,766,649 ක් වූ භාණ්ඩාගාර බිල්පතකට අදාළ රු.2,753,249 ක ලැබිය යුතු පොලී ආදායම ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අනෙකුත් භාණ්ඩාගාර බිල්පත් සඳහා ලැබිය යුතු පොලී අදායම ගණනය කිරීමේදී රු.100,868 ක් අඩුවෙන් ගණනය කර තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයෙහි අතිරික්තය රු.2,854,116 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | රු.88,766,649/- ක් භාණ්ඩාගාර බිල්පතට අදාළ පොලිය ගිණුම් කටයුතු සිදු කරන දින වන විට ලැබී නොතිබුණ බැවින් ගිණුම් ගත කිරීමට නොහැකි විය. එම මුදල හා පොලිය ගණනයේදී අඩුවෙන් ගණනය වූ රු.100,868/- ක මුදල 2020 අවසාන ගිණුම් සැකසීමේදී පෙර වර්ෂයේ ගැලපුම් (Prior adjustment) යටතේ ගලපනු ඇත. | ලැබිය යුතු පොලී ආදායම් නිවැරදිව ගණනය කර ගිණුම් ගත කළ යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පෞද්ගලික ආයතන වලින් අධිකාරියට ලැබිය යුතු රු.40,456,462 ක ණය ශේෂ සනාථන ලිපි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මේ හේතුවෙන් මෙම ණය ශේෂ විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය. | අදහස් දක්වා නොමැත. | ශේෂ සනාථ නොවූ ණය ශේෂවල භෞතික පැවැත්ම තහවුරු කරගත යුතුය. |

### 1.5.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පෞද්ගලික ආයතනයකින් වර්ෂ 14 ක වැඩි කාලයක සිට අධිකාරියට අයවිය යුතු රු.31,550,000 ක ණය ශේෂයක් සඳහා ණය ගිවිසුම ප්‍රකාරව රු.4,011,609 ක පොලී ආදායමක් ගණනය කර එය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 10 හි 33 ඡේදයට පටහැනිව වර්ෂයේ ආදායමක් | මෙහෙයුම් ක්‍රියාකාරකම් ලාභය ගණනය කිරීමේදී පොලී ආදායම ලෙස රු. 4,011,609/- ක් ආදායමට ගෙන ඇති අතර ඊට සමානම මුදලක් අඩමාන ණය අව වෙන්කිරීම ලෙස අඩුකර ඇත. එබැවින් එහි බලපෑම ශුන්‍ය වනු ඇත. විගණන විමසුමේ දක්වා ඇති පරිදි ශුද්ධ | අදාළ ප්‍රමිතිය ප්‍රකාරව ආදායම් හඳුනාගැනීම හා ඒ පිළිබඳ හෙළිදරව් කිරීම් කළ යුතු අතර හානිකරණ අගය සඳහා අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ලෙස හඳුනාගෙන එම පොලී ආදායමට සමාන ශේෂයක් අඩමාණ ණය ලෙස වෙන්කර තිබුණි. එසේ වුවත් මේ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණු අතර ඉහත ණය ශේෂය සඳහා වන හානිකරණ අගය වෙනුවෙන් අවශ්‍ය ගැලපීම්ද මූල්‍ය ප්‍රකාශන වල සිදුකර නොතිබුණි. | මුදල් ප්‍රවාහය රු. **4,011,609/-** ක් අඩුවෙන් දක්වා නොමැත. කෙසේ වෙතත් විගණන විමසුමෙහි දක්වා ඇති පරිදි මෙම අගය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍යමය නොවන වෙනස්වීම් යටතේ මෙහෙයුම් ක්‍රියාකාරකම අතිරික්තය එකතුකර එම අගයට නැවත අඩුකර මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පෙන්වීමට පියවර ගනු ඇත. | |

**2.** මූල්‍ය සමාලෝචනය

**2.1** මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.**63,223,492** ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.**74,288,048** ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.**11,064,556** ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙහෙයුම් ප්‍රතිඵලයෙහි පිරිහීමට ප්‍රධාන වශයෙන් රජයේ ප්‍රාග්ධන සහනාධාර අඩු වීම, ප්‍රාග්ධන ප්‍රදාන වලට එරෙහිව ක්‍රමක්ෂය කපා හැරීම අඩුවීම හා පාරිතෝෂිත වෙන්කිරීම් වැඩිවීම හේතු වී තිබුණි.

**2.2** අනුපාත විශ්ලේෂණය

ජංගම අනුපාතය ඉකුත් වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා **1:9.73** සිට **1:5.87** දක්වා ද ක්ෂණික අනුපාතය **1:9.40** සිට **1:5.73** දක්වා ද අඩු වී තිබුණි. ඉකුත් වර්ෂයේ සියයට **18.54** ක් වූ ලාභ අනුපාතය සමාලෝචිත වර්ෂයේ සියයට **14.49** ක් දක්වා පහත වැටී තිබුණි.

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** අනාර්ථික ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ ලියාපදිංචි මෝල්හිමියන්ගේ නිෂ්පාදන වෙළඳපොළට ඉදිරිපත් කිරීමේදී ඒවායේ යෙදීම සඳහා **2014** වර්ෂයේ සිට **2018** වර්ෂය දක්වා අනු අංක සහිත ස්ටිකර් ආකාර ලේබල් මුද්‍රණය කිරීමේදී ලියාපදිංචි මෝල් හිමියන්ගේ නිෂ්පාදන ධාරිතාවය හා ඉදිරි අවශ්‍යතාව සලකා බැලීමකින් තොරව ස්ටිකර් මුද්‍රණය කිරීම නිසා රු.**9,262,700** ක් වටිනා ස්ටිකර් **5,017,133** ප්‍රමාණයක් භාවිතයට නොගෙන ප්‍රධාන ගබඩාවේ හා සැකසුම් අංශයේ ගබඩා කර ඇති බව නිරීක්ෂණය විය. | **2017** වර්ෂයේ පැවති දැඩි නියඟය හේතුවෙන් පොල් එලදාවේ සැලකියයුතු ප්‍රමාණයකින් අඩුවීමත් සමඟ නව නිෂ්පාදකයින් නිෂ්පාදන කටයුතු වලින් ඉවත් විය. ඉතිහාසගත අඩුම පොල් අස්වැන්න වාර්තා වූ වසර ලෙස **2018** වර්ෂය පත්වීමත් සමග පොල් ආශ්‍රිත කර්මාන්තයන්ගේ විශාල කඩාවැටීමක් සිදු විය. මේ නිසා අප අපේක්ෂා කළ පරිදි නිෂ්පාදකයින් ලියාපදිංචි වීමක් හෝ ලේබල් මිලදී ගැනීමක් සිදු නොවුණි.<br><br>දැනට ගබඩාවේ ඉතිරිව ඇති ලේබල් **2020** වසරේ කර්මාන්ත | පවතින ස්ටිකර් තොග විදිමත් පරිදි ගබඩා කර තබා නිෂ්පාදකයන් වෙත නිකුත් කිරීම කඩිනම් කළ යුතු අතර එම ස්ටිකර් අවභාවිතා වීම වැළැක්වීමට අවශ්‍ය ආරක්ෂක ක්‍රියාමාර්ග ගත යුතුය. |

ලියාපදිංචි කටයුතු සිදුකරන අවස්ථාවේදීම අදාළ කර්මාන්ත ආයතන වෙත ලබාදීමට කටයුතු කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. ඊට අමතරව නැවත මුද්‍රණ කටයුතු සිදු කිරීමේදී අදාළ ආයතන වල නිෂ්පාදන ධාරිතාවය හා ඔවුන්ගේ ඉදිරි අවශ්‍යතාවද සැලකිල්ලට ගෙන මුද්‍රණය කිරීමට කටයුතු යොදා ඇත.

**3.2** කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දේශීයව නිපදවන පොල්තෙල් වල තත්ත්වය වැඩිදියුණු කර ගුණාත්මක පොල් තෙල් නිෂ්පාදනය කර ඇසුරුම් කර වෙළඳපලට ඉදිරිපත් කිරීම සඳහා දේශීය පොල් තෙල් නිෂ්පාදන කර්මාන්තායතන පෙළඹවීම අරමුණු කරමින් සැකසුම් අංශය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සඳහා 2019 වර්ෂයේ වාර්ෂික අයවැයෙන් රු.9,000,000 ක් වෙන්කර තිබුණද සැලසුම් කළ කාර්යයන් ඒ ආකාරයෙන්ම සිදු කිරීමට කළමනාකරණයට නොහැකි වීම මත වාර්ෂිකව වෙන්කරන ලද මුදලින් සියයට 57 ක් එනම් රු.5,101,307 ක මුදලක් ඉතිරි වී ඇති බව නිරීක්ෂණය විය. | මෙම ප්‍රතිපාදනයෙන් රු.3,000,000/- ක් බහාලුම් ලබා දීම වෙනුවෙන් වෙන් කර තිබුණද එක් කර්මාන්තකරුවෙකුට ලීටර් 30 ක් බහාලීම සඳහා රු.120,000/- කට වැඩි මුදලක් අධිකාරියට වැය කිරීමට සිදු වීම යුක්ති සහගත නොවන බවට 2020.01.14 දින පැවති ගුණාත්මක පොල් තෙල් සඳහා ලාංඡනය නිකුත් කිරීමේ රැස්වීමේදී කළමනාකරණය තීරණය කරන ලදී. එබැවින් මෙම බහාලුම් නිපදවා බෙදා හැරීමේ ක්‍රියාවලිය නතර කිරීමට සිදු විය. 2020 වසරේ අගෝස්තු මස වන විටත් ගුණාත්මක පොල් තෙල් සඳහා නිකුත් කිරීමට නියමිත ලාංඡනය ශ්‍රී ලංකා බුද්ධිමය දේපල කාර්යාංශය මගින් ලියාපදිංචි කටයුතු ඉටු කර අවසන් කර නොමැති බව සටහන් කරමි. | දේශීයව නිපදවන පොල් තෙල් වල තත්වය වැඩිදියුණු කිරීම සඳහා වූ සැලසුම් නිවැරදිව සකස් කිරීමත් සම්පූර්ණ කළ යුතු වූ පූර්ව අවශ්‍යතාවයන් සපුරා ගැනීමෙන් පසුව අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කරවා ගැනීමත් කළ යුතුය. |
| (ආ) | ගෙඩි පොල් භාවිතය වෙනුවට අගය එකතු කළ පොල් මද ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා ජනමාධ්‍ය යොදා ගෙන වැඩසටහන් තුනක් පැවැත්වීමට තීරණය වී තිබුණද 2019 වර්ෂය තුළ කිසිදු වැඩසටහනක් පවත්වා නොතිබුණි. තවද මේ සම්බන්දයෙන් වූ වැඩසටහනක් සඳහා 2016 දි ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව වෙත | වෙළඳ දැන්වීම් වර්ග තුනම ප්‍රචාරය කිරීම සඳහා වූ ගුවන් කාලය වෙනුවෙන් අධික පිරිවැයක් වැයවන බව සාකච්ඡා වූ බැවින් එක් වෙළඳ දැන්වීම් වර්ගයක් පමණක් (තත්පර 30 ක් බැගින් රූපවාහිනි වෙළඳ දැන්වීම් 02 ක් ) නිෂ්පාදනය කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටුව තීරණය කළ ද හිටපු සභාපතිතුමාගේ උපදෙස් ලබා ගැනීමට නොහැකි වීම මත එම කටයුතු ඉදිරියට ක්‍රියාත්මක කිරීමට | ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කිරීමේදී සැලැස්මේ අන්තර්ගත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ හැකියාව පිළිබඳ පූර්ව ඇගයීමක් කළ යුතුය. රූපවාහිනී සංස්ථාව එකඟ වී ඇති ගුවන් කාලය ලබා ගැනීම කඩිනම් කිරීම හා එම හිමිකම පිළිබඳ මූල්‍ය ප්‍රකාශන තුළ අවශ්‍ය |

| | | |
|---|---|---|
| ගෙවන ලද **රු.9,344,832** ක මුදලින් **රු.7,060,032** ක් සඳහා ගුවන් කාලයක් ලබා දීමට රූපවාහිනී සංස්ථාව එකඟ වී තිබුණද ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ පවතින විමර්ශණයක් හේතුවෙන් එම හිමිකම භාවිතා කළ නොහැකි වී තිබූ නමුත් මෙම හිමිකම මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි. | නොහැකි විය.<br>තවද දැනට ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සතුව ඉතිරිව පවතින පොල් සංවර්ධන අධිකාරියට අයත් **රු.7,060,032/-** ක මුදල ප්‍රයෝජනයට ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් එම වැඩසටහනට අදාළ **(2014)** විමර්ශන කටයුතු සිදුකරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් අවස්ථා **3** කදී විමසීම් සිදුකලද ඊට නිසි ප්‍රතිචාර මේ වන තෙක් ලබාදී නොමැත. | හෙළිදරව් කිරීම් සිදු කළ යුතුය. |

**3.3** මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **2019** වර්ෂයේ අවසන් මාස **6** තුළ පොල් සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ විද්‍යාගාරයට පොල් ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධව රැස්කරන ලද සහ බාහිර පාර්ශවයන්ගෙන් පරීක්ෂාව සඳහා සාම්පල **384** ක් ලැබී තිබුණද ප්‍රමාණවත් පරිදි විද්‍යාගාර කාර්ය මණ්ඩලයක් පවත්වාගෙන යාමට කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ නිර්ණායක ප්‍රකාරව අධිකාරිය විසින් තීරණය කරන ලද වාර්තා නිකුත් කළ යුතු දිනය ඉක්මවා තිබූ සාම්පල **127** ක් පැවතුණි. එසේම නිකුත් කර ඇති වාර්තා **257** ක් අතරින් පරීක්ෂණ වාර්තා **181** ක් නිකුත් කළ යුතු දිනය ඉක්මවා නිකුත් කර ඇති බවද විගණනයට නිරීක්ෂණය විය. | පරීක්ෂණ වාර්ථා නිකුත් නොකිරිම හා ප්‍රමාදවීම<br>තත්ව පාලන හා තත්ව ආරක්ෂණ අංශයේ පවතින සේවක හිගය හේතුවෙන් පරීක්ෂණ වාර්ථා නිකුත් කිරිමේ ප්‍රමාදවීමක් සිදුවී ඇති බව සත්‍යයක් වන නමුත් විගණන නිරීක්ෂණයේ පරිදි පරීක්ෂණ වාර්ථා නිකුත් නොකිරිම සිදුවී නැත.<br>මේ වන විට බඳවාගැනීමේ පරිපටි සංශෝධනය කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට නියමිතය. කඩිනමින් කළමණාකරණ සේවා අනුමැතිය ලබා, සේවකයන් බඳවාගැනීම සිදු කර , අප්‍රමාදව පරීක්ෂණ වාර්ථා නිකුත් කිරිමට කටයුතු කරනු ලැබේ. | අවශ්‍ය බඳවාගැනීම් කඩිනම් කර අදාළ පරීක්ෂණ වාර්තා නියමිත දිනට නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පසුගිය වසර **3** තුළදී විදේශ වෙළඳ ප්‍රදර්ශන සඳහා මුළු වියදම වශයෙන් **රු.130,775,085** ක වියදමක් දරා තිබුණද පොල් ආශ්‍රිත නිෂ්පාදන **37** ක අපනයන කාර්ය සාධනය පරීක්ෂාවේදී නිෂ්පාදන **16** ක අපනයන පහළ ගොස් තිබූ අතර **2018** හා **2019** වර්ෂයේ පොල් ආශ්‍රිත නිෂ්පාදන වල මුළු අපනයන ආදායම ඉහළ ගොස් තිබුණේ සියයට **4** වැනි සුළු ප්‍රමාණයකින් බව නිරීක්ෂණය විය. | පොල් ආශ්‍රිත භාණ්ඩ අපනයනය රඳා පවතිනුයේ වාර්ෂික පොල් නිෂ්පාදනයේ දෛනික පරිභෝජනය සඳහා ගෙඩි පොල් ප්‍රමාණය වෙන්කල පසු ඉතිරි වන ප්‍රමාණය පදනම් කරගෙන වේ. **2017** වසරේදී සහ **2018** වසරේදී වාර්ෂික පොල් නිෂ්පාදනයේ අඩුවීමක් පෙන්නුම් කර ඇති අතර පොල් නිෂ්පාදන වල මිල ගණන් ඉහළ යාම හේතුවෙන් පොල් නිෂ්පාදන වල අපනයන ප්‍රමාණය පහළ ගොස් ඇත. **2019** වසරේදී පොල් නිෂ්පාදනයේ වැඩිවීමක් දක්නට ලැබුනද පසුගිය වසර වල ආනයන කරුවන් වෙනත් තරඟකාරී රටවලින් පොල් ආශ්‍රිත නිෂ්පාදන මිලදී ගත් බැවින් ක්ෂණිකව ශ්‍රී ලාංකීය පොල් නිෂ්පාදන අලෙවි කිරීමට නැඹුරු කරවීම අපහසු වේ. | පොල් ආශ්‍රිත අපනයන ආදායම වැඩිකර ගැනීමට ඉවහල්වන පියවර නිවැරදිව හඳුනා ගැනීමෙන් අනතුරුව අදාළ ප්‍රවර්ධන වියදම් දැරිය යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2019 ක්‍රියාකාරී සැලැස්මේ දේශීය වෙළඳපල ප්‍රවර්ධනය සඳහා පොල් ආශ්‍රිත නිෂ්පාදන අලෙවිකරණය පිළිබඳ වැඩමුළු හා දැනුවත් කිරීමේ වැඩසටහන් 2 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද කිසිදු වැඩසටහනක් පවත්වා නොතිබුණි. | 2019 වසරේ අනුමත ප්‍රාග්ධන ප්‍රතිපාදන අපේක්ෂා කළ පරිදි නොලැබීම හේතුවෙන් මෙම වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | හැකිතාක් දුරට සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුගත විය යුතුය. |

### 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොල් මද ආශ්‍රිත නිෂ්පාදන වල සීනි මට්ටම, විටමින් මට්ටම සහ අපද්‍රව්‍ය මට්ටම් (PHA) පරීක්ෂා කිරීම සඳහා 2017 වර්ෂයේ රු. 6,625,660 ක මුදලකට UHPLL 3000 වර්ගයේ යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණද යන්ත්‍රය මිලදී ගැනීමට පෙර සලකා බැලිය යුතු කරුණු එනම් යන්ත්‍රය සවිකිරීමට සුදුසු ස්ථානය, ඊට අවශ්‍ය පුහුණු ශ්‍රමය සපයා ගැනීමේ ක්‍රමවේද යන කරුණු කෙරෙහි අවධානය යොමු නොකිරීම නිසා මෙම යන්ත්‍රය 2020 වර්ෂයේ අගෝස්තු 30 දක්වාම අභාවිතව පැවති බව නිරීක්ෂණය විය. | මෙම උපකරණය 2017 වසරේදී මිලදී ගත්තද, උපකරණය සවිකිරීමට නියමිත ස්ථානයේ නවීකරණ කටයුතු නිමවන තෙක් මෙම උපකරණය නිසි පරිදි පරීක්ෂණ සඳහා භාවිතා කිරීමට නොහැකිවී ඇත. කෙසේවුවද මෙම උපකරණය මේවන විට ක්‍රියාත්මක තත්වයේ පැවතියද අංශයේ සිටිය යුතු විශ්ලේෂකයන්ගෙන් 52% ක් පුරප්පාඩුවී ඇති බැවින් දෛනිකව සිදු කරන 300-400 පමණ වන පරීක්ෂණ කාර්යයන් හැර වෙනත් මෙවැනි නව පරීක්ෂණ සඳහා සේවකයන් යෙදවීම ගැටළුවක් වී ඇත. | පුරප්පාඩු සම්පූර්ණ කර නොපමාව මෙම යන්ත්‍රයේ අපේක්ෂිත භාවිතය සඳහා යොදා ගත යුතුය. |

### 3.5 ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොල් වෙන්දේසිය පැවැත්වෙන ස්ථානය ඉදිකිරීම සඳහා 2016 මැයි මස අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී තිබුණු නමුත් කොන්ත්‍රාත් පිරිවැය රු.5,389,080 ක් වූ අදාළ ඉදිකිරීම 2019 මාර්තු 26 දින ආරම්භ කර 2019 ජූලි 26 දින නිම කිරීමට නියමිතව පැවතුණද වැඩබිම කොන්ත්‍රාත්කරු වෙත නිසි පරිදි භාර නොදීම හා පසුව සිදු කළ වෙනස් කිරීම් ඇතුළත් කර සකස් කරන ලද සැලැස්ම කොන්ත්‍රාත්කරු වෙත ලබා නොදීම නිසා ඉහත කොන්ත්‍රාත්තුව 2020 ජුනි මස වන විටද නිමකරවා ගැනීමට නොහැකි වී තිබුණි. | අධිකාරියට ඉන්ජිනේරු (සිවිල්) බඳවා ගන්නා තෙක් මෙම කාර්යය ප්‍රමාද වූ අතර 2019 මාර්තු මස 26 දින ආරම්භ කරන ලද පොල් වෙන්දේසි ශාලාව සකස් කිරීමේ කාර්යය 2019 ජූලි මස 26 දින කොන්ත්‍රාත් කටයුතු නිම කිරීමට නියමිතව තිබුණද පහත සඳහන් සාධාරණ හේතු මත අළුත්වැඩියා කටයුතු ප්‍රමාද විය.<br>i. අධිකාරියේ අවශ්‍යතාවයට වඩාත් සුදුසු වන පරිදි බෙදා වෙන් කිරීම් වෙනස් කිරීමට කටයුතු කිරීම (Partition කිරීම)<br>ii. විදුලි පරිපථ පද්ධතිය වෙනස් කිරීමට සිදු වීම.<br>iii. ගිණි ගැනීමකට ලක් වූ කොටුව ආදිපාද වීදිය ගොඩනැගිල්ල සඳහා හානි පූර්ණ වන්දි මුදල් ලබා ගැනීමේ කටයුතු අවසන් වන තෙක් එම මහලේ තිබුණු අබලි කොටස් ඉවත් කර ගැනීමට නොහැකි විය. | ප්‍රසම්පාදන කාර්යයන් ආරම්භ කිරීමට ප්‍රථම පූර්ව අවශ්‍යතාවයන් සපුරා ගැනීමට ක්‍රියාකළ යුතුවීම හා ප්‍රසම්පාදන කාර්යයන් ආරම්භ කර තිබූ මෙම ඉදිකිරීම කඩිනමින් නිමකරවා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

iv. අප්‍රේල් මස රටේ ඇති වූ හදිසි ආපදා තත්ත්ව මත රටේ ආරක්ෂාව තරකර තිබීම හේතුවෙන් කොළඹ පොලිස් ස්ථානය ලබා දෙන ලද උපදෙස් පරිදි මෙම ස්ථානය නවීකරණ කටයුතු නවතා දැමීමට සිදු විය.

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොල් සංවර්ධන අධිකාරියේ පවතින ප්‍රධාන තනතුරු වන අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ (පරිපාලන), අධ්‍යක්ෂ (සැකසුම් සංවර්ධන), අධ්‍යක්ෂ (අලෙවිකරණ ජාත්‍යන්තර), නීති නිලධාරී, පර්යේෂණ නිලධාරී, පරිපාලන නිලධාරී, පොත් තබන්නා (තනතුරු දෙකක්) යන තනතුරු වල පවතින පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු නොකිරීම නිසා අධිකාරියේ අරමුණු සහ කාර්යයන් ඉටුකර ගැනීමේදී එය බාධාවක් වී තිබුණු බව නිරීක්ෂණය විය. | • අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂ (පරිපාලන), අධ්‍යක්ෂ (අලෙවිකරණ) ජාත්‍යන්තර, පරීක්ෂණ නිලධාරී තනතුරු සඳහා තනතුරු අයදුම්පත් කැඳවා වසරකට ආසන්න කාලයන් ගත වී ඇති බැවින් තීරණයක් ලබාගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට මණ්ඩලීය පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත.<br><br>• අධ්‍යක්ෂ (සැකසුම් සංවර්ධන) තනතුර පාර්ලිමේන්තු මැතිවරණය හේතුවෙන් බඳවා ගැනීම් අත්හිටුවා ඇත.<br><br>• නීති නිලධාරී තනතුරට සුදුසු අයදුම්කරුවකු නොමැති වීම හේතු කොට ගෙන බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් විමසන ලද නමුත් එම දෙපාර්තමේන්තුව ඊට එකඟ නොවීය. එබැවින් මෙම තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට කටයුතු කරමින් පවතී.<br><br>• පරිපාලන නිලධාරි තනතුර සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් විභාග වන බැවින් එම නඩුවේ තීන්දුව ලබාදෙන තුරු බඳවා ගැනීමට නොහැකි වී ඇත.<br><br>• පොත් තබන්නා තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණය පවත්වා වසරකට ආසන්න වී ඇති බැවින්, අදාළ බඳවා ගැනීම් සඳහා තීරණයක් ලබාගැනීමට 2020.07.31 දින පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර ඇත. | මෙම පුරප්පාඩු පිරවීම කඩිනම් කළ යුතුය. |